DOI: 10.31357/fhssmph.2006.00084

# ශ්‍රී ලංකාවේ සමයාන්තර ප්‍රයාණය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක් (1960 සිට 2005)

අනෝමා රංජනී කරුණානායක

දර්ශනපති උපාධිය 2006

# ශ්‍රී ලංකාවේ සමයාන්තර ප්‍රයාණය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක් (1960 සිට 2005)

සම්පූර්ණ නම -: අනෝමා රංජනි කරුණානායක

ලියාපදිංචි අංකය -: GS /SS /874/99

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

ගංගොඩවිල

26 MAR 2006

## සහතිකය

ශ්‍රී ලංකාවේ සමයාන්තර ප්‍රයාණය (1960 සිට 2005) නමැති දර්ශනපති උපාධි පරීක්ෂණය සඳහා ම විසින් ඉදිරිපත් කරන ලද නිබන්ධය පිළිබඳ ව 2006.09.12 දින පැවැති වාචික පරීක්ෂණයේ දී නිබන්ධ පරීක්ෂකවරුන් ඉදිරිපත් කර තිබූ නිර්දේශ දැඩි සැලකිල්ලට ගන්නා ලදී. ඒ අනුව හැඳින්වීමේ පරිච්ඡේදයත් නිගමන පරිච්ඡේදයත් නැවත සකස් කළ යුතු බවටත් සම්පූර්ණ කෘතියේ භාෂාමය හා ව්‍යාකරණ දෝෂ නැවත සකස් කළයුතු බවටත් මේ සඳහා තුන්වැනි උපදේශකවරයකු ලෙස මහාචාර්ය ආරියපාල පෙරේරා මහතා පත් කිරීමටත් තිරණය විය.

ඒ අනුව එතුමාගේ උපදෙස් හා සුපරීක්ෂණය යටතේ හැඳින්වීමේ පරිච්ඡේදය හා නිගමන පරිච්ඡේදය සම්පූර්ණයෙන් ම නැවත සකස් කළ අතර කෘතියේ ව්‍යාකරණ හා භාෂාමය දෝෂ නිවැරදි කොට නැවත ඉදිරිපත් කරමි.

මෙයට,

දිනය 2006.12.07

Arkayake
.....................................
අනෝමා රංජනි කරුණානායක

## තුන්වැනි උපදේශකවරයාගේ නිර්දේශය

මවිසින් ශ්‍රී ලංකාවේ සමයාන්තර ප්‍රයාණය (1960 සිට 2005 දක්වා) නමැති නිබන්ධය නිවැරදි ව හා උනන්දුවෙන් සම්පූර්ණයෙන් ම නැවත සංස්කරණය කරවූ බවත් මෙම සංශෝධිත නිබන්ධය දර්ශනපති උපාධි ප්‍රදානය සඳහා සුදුසු බවත් නිර්දේශ කරමි.

07.12.2006
.....................................
දිනය

.....................................
මහාචාර්ය ආරියපාල පෙරේරා
තුන්වැනි උපදේශක

අධ්‍යයනාංශ ප්‍රධාන නිර්දේශය,

නිර්දේශ කොට ඉදිරිපත් කරමි.

.....................................
කේ. ඒ. වීරසේන
අධ්‍යයනාංශ ප්‍රධාන
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

2006.12.07
.....................................
දිනය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ. ඒ. වීරසේන
අධ්‍යයනාංශ ප්‍රධාන
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**පිදුම**

*අම්මා නැති වූ දා පටන්*

*අපට ආදරණීය මවක්*

*වීමට වෙරදරන*

*මා දයාබර පියාණන්ගේ*

*පා පියුම් වලට.*

# ස්තුතිය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන "ශ්‍රී ලංකාවේ සමයාන්තර ප්‍රයාණය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක් 1960 - 2005" නම් වූ මෙම නිබන්ධය සාර්ථක කිරීමෙහිලා විවිධ අන්දමින් උදව් උපකාර කළ අය බොහෝ වෙති. මෙහිදී මෙම මාතෘකාව තෝරා ගැනීමේදී මට මතු වූ ගැටළු අවම කොට ඒ සඳහා උදව් කළ මාගේ ප්‍රධාන උපදේශක මහාචාර්ය චන්දිම විජේබණ්ඩාර හා මෙම නිබන්ධයේ සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණය සම්බන්ධ ව උපදෙස් දුන් මහාචාර්ය බී. ඒ. ටෙනිසන් පෙරේරා යන ගුරු පියවරුන්ට ද මගේ කෘතඥතාව පළ කරමි.

එසේම මෙම කාර්ය සඳහා නොපසුබට ව මා දිරිමත් කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ මහාචාර්යවරයෙකුව සිටි දැනට කුලපති ධූරය දරණ බෙල්ලන්විල විමලරතන හිමිපාණන්ට ද එම අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන ලෙස කටයුතු කරන කේ. ඒ. වීරසේන මහතා ඇතුළු ආචාර්ය මණ්ඩලයටද මම ස්තුතිවන්ත වෙමි.

නන් අයුරින් උදව් උපකාර කළ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ හිටපු මහාචාර්ය අපවත් වී වදාළ මහාචාර්ය මීගොඩ පඤ්ඤාලෝක හිමිපාණන් ද මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහතාද, මහාචාර්ය ආරියපාල පෙරේරා මහතා ද මෙහිදී කෘතඥතා පූර්වකව සිහිකරමි.

මෙම අධ්‍යයයන කටයුතු කරගෙන යෑමට අත හිත දුන් කිප දෙනා අතර ශාන්ත ඇලෝසියස් දෙව් සත්සලෙහි ආචාර්ය වරයෙකු වූ ලලිත් පෙරේරා පියතුමාට ද, පොලිස් දෙපාර්තමේන්තුවෙන් පොලිස් වාර්තා ලබා දීමට කාරුණික වූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නන්දන මුණසිංහ මහතාට ද මගේ ස්තුතිය හිමි වේ.

විවිධ ඉංග්‍රීසි පොත පත ඇසුරු කිරීමට උදව් කළ ආදරණීය පියාණන්ට හා දයාබර අක්කාටත් විවිධ අභියෝග හමුවේ නොසැලී සිටින්නට මට ශක්තියක් වූ දයාබර අමිත ඇතුළු මිතුරු මිතුරියන් කැළත් කිසිසේත් අමතක කළ නොහැකිය.

අවසාන වශයෙන් මේ සද්කාර්යයෙහිලා කැප වීමෙන් කටයුතු කළ ඩී. එම්. අයි. කොම්යුනිකේෂන් ආයතනයේ අධිපතිනිය ඇතුළු කාර්ය මණ්ඩලයට ද මගේ ගෞරවණීය ස්තුතිය හිමි වේ.

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| **හැඳින්වීම** | | I - V |
| **පළමුවැනි පරිච්ඡේදය** | | 1 -47 |
| **1960 දශකයට පෙර ශ්‍රී ලංකාවේ බුදුසමය හා කිතුසමය** | | |
| 1.1 | 1946 ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් ආගම් හා ආගමික ආයතන පිළිබඳ නීතිය, ආගම් විෂයෙහි කරනු ලබන බලපෑම්. | 1 - 5 |
| 1.2 | නිදහසින් පසු යුගයේ ශ්‍රී ලංකාව තුළ පැවති සමාජ ආගමික දේශපාලන තත්ත්වයන්. | 5 - 10 |
| 1.3 | රජය සහ ආගමික නායකත්වය. | 10 - 47 |
| **දෙවැනි පරිච්ඡේදය** | | 48 - 83 |
| **ශ්‍රී ලංකාවේ රාජ්‍ය නො වන සංවිධානවල ක්‍රියාකාරීත්වය.** | | |
| 2.1 | එම සංවිධාන බිහිවීමට බලපෑ සමාජ ආර්ථික දේශපාලනික පසුතලය. | 48 - 51 |
| 2.2 | ශ්‍රී ලංකාවේ රාජ්‍ය නො වන සංවිධාන වල ආරම්භය, අරමුණු, කාර්ය භාරය හා ව්‍යාප්තිය. | 51 - 56 |
| 2.3 | ජාත්‍යන්තර බලවේග සහ රාජ්‍ය නො වන සංවිධාන අතර පවතින සම්බන්ධතාව. | 56 - 59 |
| 2.4 | රාජ්‍ය නො වන සංවිධාන හා ක්‍රිස්තියානි නිකායන් අතර සබැඳියාව, කිතුනු නිකායන්ගේ ඓතිහාසික වර්ධනය. | 59 - 83 |
| **තුන්වැනි පරිච්ඡේදය** | | 84 - 152 |
| **සමයාන්තර කරණයෙහිලා ක්‍රිස්තියානි මිෂනාරි ව්‍යාපාරයේ නව උපාය මාර්ග.** | | |
| 3.1 | සමයාන්තර කරණය හා සබැඳි ඓතිහාසික පසුබිම. | 84 - 97 |

3.2 බෞද්ධයින් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීම සඳහා රාජ්‍ය නොවන ඇතැම් ක්‍රිස්තියානි සංවිධාන යොදාගනු ලබන උපක්‍රම. 97 - 121

3.3 එම උපාය මාර්ග විෂයෙහි බෞද්ධ ප්‍රතිචාර සහ ඒ තුලින් මතුවී ඇති ගැටළු. 121 - 152

**හතරවැනි පරිච්ඡේදය.** 153 - 178

**බෞද්ධයින් ක්‍රිස්තියානි ආගමට යන්නේ ඇයි ?**

4.1 නූතන සංවර්ධන දර්ශනය හා බෞද්ධ සංකල්ප අතර උද්ගතවී ඇති ගැටුම් කාරී ස්වභාවය. 153 - 159

4.2 ජනතා ප්‍රශ්නවලට පිළියම් යෙදීමට භික්ෂූන් වහන්සේට ඇති අපහසුකම් සහ බෞද්ධ භික්ෂූන් වහන්සේලා සමග ඇතිකරගන්නා පෞද්ගලික අර්බුද. 160 - 166

4.3 දහම් අධ්‍යාපනයේ සහ ධර්ම සන්නිවේදනයේ දුබලතා 166 - 178

**පස්වැනි පරිච්ඡේදය** 179 - 202

**වර්තමාන බෞද්ධයින් මුහුණපා ඇති ආගමික අභියෝග.**

5.1 අන්‍යාගමික අභියෝග, බෞද්ධ භික්ෂුව හා බෞද්ධයන්ගේ කාර්යභාරය. 179 - 189

5.2 මෙම තත්ත්වය හමුවේ රජය ගෙන ඇති ක්‍රියාමාර්ග හා ගතහැකි ක්‍රියාමාර්ග. 189 - 202

නිගමන පරිච්ඡේදය. 203 - 206

අදාළ පොලිස් ස්ථාන වලින් ලබාගත් තොරතුරු 208 - 209

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය. 210 - 221

## හැඳින්වීම.

කිස්තු පූර්ව තුන්වැනි සියවසේ දී මිහිඳු මාහිමියන් විසින් ලංකාවට හඳුන්වා දුන් බුද්ධාගම මෙරට ජීවත් වූ සිංහල ජනතාව දිවි හිමියෙන් වැළඳ ගත්හ. නොබෝ කලකින් සිංහල සංස්කෘතිය හා සභ්‍යත්වය බෞද්ධ වටපිටාවත් සමග ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත විය.

අනුරාධපුර යුගයේ සිට ම හින්දු ආගමික - සංස්කෘතික බලපෑම් ලංකාව පුරා විහිදී තිබුණ ද බෞද්ධ - හින්දු ආගම් භාරතීය සමාජ ගති ලක්ෂණ අනුගමනය කළ නිසා ඔවුන් අතර ප්‍රබල ගැටුම් ඇති නොවීය.

එහෙත් 15 වැනි සියවසෙන් පසු පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසින් මෙරට පාලනය කරන ලද්දේ ඔවුන් ගේ ආගම වූ ක්‍රෛස්තව ධර්ම ද තුළින් ව්‍යාප්ත කරවමිනි. සිංහල බෞද්ධ අනන්‍යතාව වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම ක්‍රි.ව 15 වැනි සියවස දක්වා ආරක්ෂා වූ අතර යටත් විජිත පාලනය විසින් හඳුන්වා දෙන ලද ක්‍රිස්තියානි ආගමික සම්ප්‍රදායයන් මෙරට ව්‍යාප්ත වීමත් සමග ශ්‍රී ලංකාව බහු ආගමික ලක්ෂණ දරන රටක් බවට පත්විය. එම නිසා අද වන විට ආගමික වශයෙන් ප්‍රශ්න ගණනාවකට මුහුණ දීමට ශ්‍රී ලංකාවට සිදු වී ඇත.

බෞද්ධයන් ක්‍රිස්තු ලබ්ධියට හරවා ගැනීම මෑත කාලයේ බොහෝ දෙනාගේ අවධානයට යොමු වූ ගැටළුවකි. මෙහිදී අන්‍යාගමිකරණය හෙවත් සමයාන්තර ප්‍රයාණය ගැටළුවක් වන්නේ කෙසේදැයි ඇතැමෙකුට විමතියක් ඇති විය හැකිය. බහු ආගමික රටක වුවද සමයාන්තර ප්‍රයාණය භක්තිමත් ආගමිකයන් තුළ යම් යම් සිත් තැවුල් උදාකෙරෙයි. ශ්‍රී ලංකාවේ තත්ත්වය වඩාත් සංකීර්ණය. බෞද්ධයන් වෙනත් ආගම් වලට විශේෂයෙන් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීමේ ක්‍රියාවලිය තුළ සාදාචාරමය නො වන කුමන්ත්‍රණ හා උපක්‍රම ක්‍රියාත්මක වෙතැයි නිතර නිතර චෝදනා නැගේ.

ශ්‍රී ලංකාවේ බෞද්ධයන් කිතුනු ලබ්ධියට හරවා ගැනීමේ සමයාන්තර ප්‍රයාණය පිළිබඳ ව විධිමත් ශාස්ත්‍රීය විමර්ශනයක් කිරීම මාගේ අරමුණ විය. බුදුසසුනට අභියෝගයක් වී ඇති නව කිතුනු සභාවන් හා ඒවායේ ක්‍රියාත්මක වැඩ පිළිවෙල පිළිබඳ ශාස්ත්‍රීය ලෙස විමසීම අර්ථවත් වෙතැයි යන උපන්‍යාසය මත විද්වතුන්ගේ උපදෙස්ද සලකා බලා මෙම පර්යේෂණය සැලසුම් කෙළෙමි.

## II පසුබිම

දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ලොව දේශපාලනික යටත් විජිත පාලන සමය අවසන් වෙද්දී 1948 දී ශ්‍රී ලංකාවට ද නිදහස ලැබිණි. නිදහස් ලෝකයේ ඇති වූ දේශපාලනික වෙනස්වීම් යම් යම් ආකාරයන්ට කිතුනු සභාවට ද බලපා ඇති බව පෙනේ. ඒ බැව් 2002 බුද්ධ ශාසන ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ දැක්වෙන පහත සඳහන් ප්‍රකාශයෙන් තහවුරු වේ.

"මෙම අළුත් තත්ත්වය සමාලෝචනය කිරීම සඳහා 1959 දී රෝමානු කතෝලික සභාව විසින් වතිකානු සම්මේලනය පවත්වන ලදී. ලෝකයේ සැම රටකින් ම පාහේ කතෝලික බිෂොප්වරුන් 4000 ක් පමණ එම සම්මේලනයට සහභාගි කර වූ අතර එහිදී ගත් තීරණ ලොව පුරා ක්‍රියාත්මක කිරීමට ඔවුන්ගෙන් ප්‍රතිඥා ලබා ගන්නා ලදී."

බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය වාදයෙන් නිදහස ලබා අට වසරකට පසු බණ්ඩාරනායක අගමැතිතුමා විසින් තම කතෝලික ලබ්ධිය අතහැර සිංහලය රාජ්‍ය භාෂාව කරන බවට හා බෞද්ධ සංස්කෘතිය යළි පුනරුත්ථාපනය කරන බවට පොරොන්දු දී සිදු කළ දේශපාලන විප්ලවයට එරෙහි ව ලංකාවේ ප්‍රබල ව ක්‍රියාත්මක වූ "කතෝලික ආක්‍රමණ" ව්‍යාපාරය බණ්ඩානායක ඝාතනයත් සමග නැවත ප්‍රබල තත්ත්වයට පත් විය. විවිධ විදේශිය රාජ්‍ය නොවන සංවිධාන මේ යුගයේ සිට ලංකාව පුරා ව්‍යාප්ත වූ අතර සිරීමා බණ්ඩාරනායක රජයෙන් කතෝලික පාසල් රජයට ගැනීමත් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් සතු ව පැවැති ඛනිජතෙල් සමාගම්, ත්‍රිකුණාමලයේ නාවික මූලස්ථානය, කටුනායක ගුවන් තොටුපල රජයට ගැනීමත් නිසා හැටේ දශකය තුළ ඉහත කී ව්‍යාපාරයන්ට විරුද්ධ ව සිදු වූ කතෝලික ආක්‍රමණ විවිධ ස්වරූපයන්ගෙන් වේගවත් ව ක්‍රියාත්මක විය. මා විසින් මාතෘකාවට අදාළ ව 1960 දශකය තෝරා ගනු ලැබුවේ එම ඓතිහාසික පසුබිම පිළිබඳ කරුණු සලකා බැලීමෙන් පසුව ය.

## III පූර්ව අධ්‍යයන

මෙම ක්ෂේත්‍රයට අදාළ ව මෙතෙක් කර ඇති ශාස්ත්‍රිය අධ්‍යයන ඉතා අල්ප ය. 2002 බුද්ධශාසන ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ 9 වැනි පරිච්ඡේදයෙන් ද, 1998 දී ආචාර්ය සසංක පෙරේරා New Evangelical Movements and Conflicts in South Asia Sri Lanka and Nepal in Perspective යන කෘතියෙන්ද, ජූඩ් නිකලස් ප්‍රනාන්දු පියතුමා "පිපාසයට දිය" නැමැති කෘතියේ මේ පිළිබඳව කිතුනු දෘෂ්ටිකෝණයෙන් ද, Report of the Presidential Commission of Inquiry in Respect of Non Governmental Organizations Functioning in Sri Lanka 1991, Padmini Abeywardena , Role of Non – Governmental

Organizations and Government N.G.O Relations යන පර්යේෂණයෙන් ද ආගමට හැරවීම සම්බන්ධ ව ලිපි ලේඛන අන්තර්ගත වූ 2005 - 2006 "ඩයලොග්" සගරාවේ ද, මහාචාර්ය අසංග තිලකරත්න ආගමික හරවා ගැනීම් සම්බන්ධ ව බෞද්ධ දෘෂ්ටිය යන තේමාවෙන් සම්පාදිත ලිපියෙන් ද මෙම අධ්‍යයනයට අදාළ ක්ෂේත්‍රය සාකච්ඡා කර ඇත. මේ සියල්ල පරීක්ෂණ වාර්තා මට්ටමින් වැදගත් කමක් දරයි. මගේ පර්යේෂණයේ විශේෂත්වය වනුයේ බෞද්ධ ජනතාව ක්‍රිස්තියානියට හැරවීම සම්බන්ධ ව ජාත්‍යන්තර සංවිධාන හා සබැඳි ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන කේන්ද්‍රීය සාධකයක් වන බව සනාථ කිරීමත්, විධිමත් සමාජ ආර්ථික හා මනෝ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයන්ගෙන් කරුණු විමසා බලා, නිගමනයන්ට එළඹීමත් ය.

## IV. ගැටළුව හා අරමුණ

මෙම පර්යේෂණයට අදාළ ගැටළුව වනුයේ සදාචාරාත්මක නොවන උපාය මාර්ග අනුගමනය කරමින් බෞද්ධයන් කිතුනු ආගමට හැරවීම යි. මෙම ප්‍රස්තුතය සමස්ත අධ්‍යයනයේම ප්‍රධාන ගැටළුව වෙයි. ආගමික දේශපාලනික අභිවෘත්තීන් පෙරදැරි කරගෙන සමාජ විද්‍යාවේ මානව ශාස්ත්‍ර පර්යේෂණයේ අනුගත විධි ක්‍රම අනුගමනය කරමින් විධිමත් ශාස්ත්‍රීය අධ්‍යයනයක් කිරීම මගේ අභිප්‍රාය විය.

## V. ක්‍රමවේදය

පර්යේෂණය සඳහා දත්ත හා තොරතුරු ලබා ගැනීමේදී ලිඛිත හා අලිඛිත මූලාශ්‍ර වලට මූලිකත්වයක් ලැබිණ. අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදු කර ඇති විද්වතුන්ගේ අදහස් හා මත ප්‍රාථමික මූලාශ්‍ර ලෙස අධ්‍යයනය සඳහා යොදා ගනු ලැබීය. ලිඛිත මූලාශ්‍ර පරිශීලනය කිරීමේදී වඩාත් උනන්දු වූයේ හැකිතාක් ද්විතියික මූලාශ්‍ර උපයෝගී කර ගැනීමට යි. ලිඛිත නොවන මූලාශ්‍රයන් ද පර්යේෂණයේදී ඉතාමත් වැදගත් විය. මේ පර්යේෂණයේදී ක්ෂේත්‍ර අධ්‍යයනට ද මුල්තැනක් හිමි විය. මුලදී බෞද්ධයන් වී සිටි වර්තමානයේ අබෞද්ධයන් බවට පත් වූ පිරිස් ද, භික්ෂූන් වහන්සේලා, නව කිතුණු සභාවන්හි පාස්ටර්වරුන් මෙන්ම අන්‍යාගම් කරණයට එරෙහි ව ක්‍රියාකරණ ලාංකික සමාජයේ වෙසෙන විවිධ පුද්ගල කණ්ඩායම් හා ආයතන දත්ත දායකයන් ලෙස යොදා ගන්නා ලදී.

පර්යේෂණය සඳහා තොරතුරු ලබා ගැනීමේදී බහුල ව අන්‍යාගම්කරණය සිදුවන බස්නාහිර, මධ්‍යම හා උතුරු මැද යන පළාත් තුන කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙළෙමි. අනෙකුත් පළාත් වල ද අන්‍යාගම්කරණය වන බවට වාර්තා ලැබී තිබුණත් ඒ පිළිබඳ සංවේදී ප්‍රශ්න වැඩි ගණනාවක් මතු වී ඇත්තේ මෙම පළාත් වල බැවින් ඒ සම්බන්ධ ව මගේ විශේෂ අවධානය යොමු කරණ ලදී. මෙම පර්යේෂණයේදී දත්ත රැස් කිරීමේ ක්‍රම ලෙස ප්‍රශ්නාවලි ක්‍රමය, සම්මුඛ සාකච්ඡා, හා සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමය ද

භාවිත කෙළෙමි. පර්යේෂණයට අදාළ විශේෂිත ආගමික නිකායන් නියෝජනය කරන පුද්ගලයන් ද, දේව ජන සමුළු රැස්වීම් හා යාච්ඤා මධ්‍යස්ථානයන්ට සහභාගි වී නිරීක්ෂණය කොට කරුණු ලබාගත් අතර පොලිස් වාර්තා මගින් ද තොරතුරු රැස් කෙළෙමි. ද්විතියික මූලාශ්‍ර ලෙස වෙනත් ශාස්ත්‍රීය පර්යේෂණ කෘති, පුවත්පත් හා සඟරා ද භාවිත කෙළෙමි. මවිසින් රැස් කර ගන්නා ලද දත්ත උපයෝගි කරගෙන පෞද්ගලික සාකච්ඡා මගින් ද කරුණු අධ්‍යයනය කරමින් වඩාත් සත්‍ය තොරතුරු පිළිබඳ ව විශ්වසනියත්වය, කාලිනත්වය, අදාළත්වය හා අපක්ෂපාතිත්වය තහවුරු කිරීමට වෑයම් කෙළෙමි.

## VI. පරිච්ඡේද ව්‍යුහය

මෙම අධ්‍යයනයේ පළමුවැනි පරිච්ඡේදයෙන් ප්‍රධාන වශයෙන් විමර්ශනයට භාජනය වන්නේ 1960 දශකයට පෙර ශ්‍රී ලංකාවේ බුදුසමය හා කිතුසමය පිළිබඳ ව පැවැති තත්ත්වය යි. එහිදී 1946 ලංකාණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් ආගම් හා ආගමික ආයතන පිළිබඳ නීතිය ද, ආගම් විෂයයෙහි කරනු ලබන බලපෑම් ද සංක්ෂිප්ත ව විස්තර කර ඇති අතර එම යුගයේ දේශපාලන සමාජ ආගමික තත්ත්වය ගැන ද අවධානය යොමු කෙරිණි. ලංකාව නිදහස ලබා ගැනීමට පෙරට වඩා දේශපාලන තත්ත්වය හා ජනජීවිතය කෙරෙහි ආගමික හැඟීම් බලපෑවේ නිදහසින් පසුව ය. නිදහසෙන් පසු එළඹි දශකයේ අවසාන කාලයේ දී ආගම් සම්බන්ධයෙන් ඇති වූ විවිධ ප්‍රශ්න දේශපාලන ක්ෂේත්‍ර අවධානයට ලක් විණි. විශේෂයෙන් 1956 යේ මැතිවරණයෙන් පසු බුදුදහමට හා සංස්කෘතියට ලැබී තිබුණ තැන ද මෙම පරිච්ඡේදයේ විශේෂ අවධානයට යොමු කරණ ලදී.

දෙවන පරිච්ඡේදයේ දී ශ්‍රී ලංකා රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරීත්වයක්, එවන් සංවිධාන ආරම්භ වීමට බලපෑ සමාජ ආර්ථික පසුබිමත් එසේම ඒවායේ අරමුණු කාර්යභාරය හා ව්‍යාප්තියත් සාකච්ඡාවට ලක්කෙරේ. රාජ්‍ය නොවන සංවිධාන වල සුවිශේෂි ලක්ෂණ ඇත. මෙවන් රාජ්‍ය නොවන සංවිධාන හා ජාත්‍යන්තර බලවේග අතර ඇති සම්බන්ධතාව සොයා බැලීම ද මෙම පරිච්ඡේදයේ එක් අරමුණක් විය. අදාළ මූලාශ්‍ර උපුටා දක්වමින් රාජ්‍ය නොවන සංවිධාන හා ක්‍රිස්තියානි නිකායන් අතර ඇති සම්බන්ධය තවදුරටත් මෙම පරිච්ඡේදයෙන් සාකච්ඡා වන්නේ එවැනි ආගමික නිකායන් රාශියක් ද හඳුන්වා දෙමිනි. මේ එක් එක් නිකායවල කාර්යභාරය ද මෙහිදී කෙටියෙන් සාකච්ඡා කෙළෙමි.

තුන්වැනි පරිච්ඡේදයේ තේමාව වූයේ සමයාන්තර කරණයෙහිලා නව උපාය මාර්ග පිළිබඳ පුළුල් විග්‍රහයක් කිරීමයි. සමයාන්තර කරණය හා සම්බන්ධිත ඓතිහාසික පසුබිම ශතවර්ෂ දෙක තුනක් එහාට යයි. විශේෂයෙන් බ්‍රිතාන්‍ය යුගයේදී මේ තත්ත්වයේ යම් ආරම්භක වර්ධනයක් වූ බව ද පෙනේ. බෞද්ධයින් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීම සඳහා රාජ්‍ය නොවන ඇතැම් ක්‍රිස්තියානි සංවිධාන ක්‍රියා කරණ ආකාරය පිළිබඳව ද පුළුල්

විග්‍රහයක් මෙම පරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇත්තේ එම උපාය මාර්ග විෂයෙහි බෞද්ධ ප්‍රතිචාර හා ඒ ආශ්‍රිත ගැටළු ගැන ද අවධානය යොමු කරමිනි.

හතරවැනි පරිච්ඡේදයට පාදක වී ඇත්තේ බෞද්ධයින් ක්‍රිස්තියානි ආගමට යන්නේ ඇයි ද යන ප්‍රශ්නය විග්‍රහ කිරීමට යි. සමකාලීන විවෘත ආර්ථිකයේ සංවර්ධනය හා බෞද්ධ සංකල්ප අතර උද්ගත වන ගැටුම් ගැන මෙහිදී පැහැදිලි කරන්නේ ප්‍රස්තුතයට අදාළ කර ගනිමිනි. එසේම ජනතා ප්‍රශ්න වලට පිළියම් යෙදීමට භික්ෂූන් වහන්සේලාට ඇති ප්‍රායෝගික අපහසුකම් හා බෞද්ධ භික්ෂූන් වහන්සේලා සමග ඇති කර ගන්නා පුද්ගලික ගැටුම් ද මෙම පරිච්ඡේදයෙන් විස්තර කර ඇත. අදාළ මූලාශ්‍ර භාවිත කොට ගෙන බුදුදහම පුද්ගල ජීවිතයට සම්බන්ධ කරගන්නා ආකාරය ගැන ද තවදුරටත් මෙමගින් විග්‍රහ කෙළෙමි.

පස්වැනි පරිච්ඡේදයේදී වර්තමාන සමාජයේ බෞද්ධයන් අන්‍යාගමික අභියෝග වලට මුහුණ පා තිබෙන ආකාරය පිළිබඳ ව අවධානය යොමු කෙළෙමි. අන්‍යාගමික අභියෝග ඉදිරියේ බෞද්ධයන්ගේ කාර්යභාරය විග්‍රහ කරමින් මේ රටේ ප්‍රධාන යතිවරයන්ගෙන්, සම්මුඛ පරීක්ෂණයන්ගෙන් ලබා ගත් තොරතුරු ද එම ගැටළු සම්බන්ධ උන් වහන්සේලාගේ අදහස් ද මෙහිදී විශ්ලේෂණය කෙළෙමි. මීට අමතර ව මෙම අභියෝග හමුවේ රාජ්‍ය මට්ටමෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කිපයක් ද සාකච්ඡාවට බඳුන් කොට ඇත. රජය මගින් ස්ථාපිත බෞද්ධ ආයතන පිළිබඳව ද විස්තර කෙටියෙන් මෙහි සඳහන් කොට ඇත.

නිගමන පරිච්ඡේදයේදී මා බලාපොරොත්තු වූයේ අන්‍යාගමී කරණය ලංකාවේ බෞද්ධ ප්‍රජාවගේ ප්‍රශ්නයක් බවට පත්වී ඇති ආකාරය ශාස්ත්‍රීය පසුබිමකින් විශ්ලේෂණය කොට දත්ත නිරීක්ෂණ සුපරීක්ෂණ ක්‍රම මගින් එළඹෙන නිගමන පැහැදිලි ව දැක්වීම යි. ඒ අනුව ගිහි පැවිදි බෞද්ධයන් සමාජ අර්බුද හා විවිධ සමයාන්තර ගැටලු වලට ප්‍රතිචාර දැක්විය යුත්තේ ආගමික ශික්ෂණයකින් හා අවබෝධයකින් මිස සටන්කාමී විරෝධතා වලින් පමණක් නොවන බව ද පැහැදිලි විය. බෞද්ධ ආයතන වල වගකීම් හා යුතුකම් නිසියාකාර ව ඉටු නොවන ප්‍රදේශවල මේ ගැටලුව වඩාත් අභියෝගාත්මක ස්වරූපයකින් වර්ධනය වී ඇති අයුරු ද දිස් විය.

ජනතාවගේ ආගමික සංස්කෘතික ජාතික උරුමයන් සුරැකීමෙහිලා අවශ්‍ය නීතිරීති මැනවින් සම්පාදනය කිරීමේ රටේ ව්‍යවස්ථාදායකත්වයේ වගකීමත්, පනවා ඇති නීතිරීති වලට පටහැනි ව ක්‍රියාකරන ජාත්‍යන්තර හෝ ජාතික සංවිධාන වලට මෙන්ම පුද්ගලයන්ට ද ඉඩ නොතැබීමේ වැදගත් කමත් මෙම පර්යේෂණයේ නිගමනයන් ලෙස දැක්විමි.

# 1 පරිච්ඡේදය

# 1960 දශකයට පෙර ශ්‍රී ලංකාවේ බුදුසමය හා කිතුසමය

## 1.1 1946 ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් ආගම් හා ආගමික ආයතන පිළිබඳ නීතිය, ආගම් විෂයයෙහි කරනු ලබන බලපෑම්

ලංකාවේ අවසාන ස්වාධීන පාලන කේන්ද්‍රය වූ මහනුවර රාජධානිය වර්ෂ 1815 මාර්තු මස දෙවැනි දින අත්සන් කළ උඩරට ගිවිසුමින් බ්‍රිතාන්‍යයන් යටතට පත් විය.[1] ඉංග්‍රීසින් හා සිංහල අධිපතීන් අතර ඇති කර ගන්නා ලද ගිවිසුම අනුව බ්‍රිතාන්‍යයේ රජතුමා කන්ද උඩරට රාජ්‍යයේ ද රජු වශයෙන් පිළිගැනීමත් සමගම සමස්ත ලංකාද්වීපය එවකට ලොව පැවැති විශාලතම අධිරාජ්‍යයේ කොටසක් බවට පත්විය.[2] එම ගිවිසුමේ 5 වන වගන්තිය මෙසේය :-

"මෙකී රටවල මුලාදෑනි සහ වැසියනුත් අදහන්නා වූ බුද්ධශාසනය හා දේවාගම ද කඩ කළ නොහැකි ව පවත්වන්ඩ ඕනෑවා සහ එහි කටයුතු ද සංඝයා ද විහාරස්ථානය ද දේවාල ද පවත්වන්ඩ හා ආරක්ෂා කරන්ඩත් ඕනෑය" [3] යන්න විය.

මෙම ගිවිසුම මගින් බුද්ධ ශාසනය රැකීම කඩ කළ නොහැකි බව "තිර ලෙසම පිළිගත් කොන්දේසියකි."[4] උඩරට රාජධානිය ඈඳා ගැනීමේ දී බ්‍රිතාන්‍ය පාලකයින් මුහුණ දුන් ප්‍රධාන ගැටළුව වූයේ උඩරට බහුතර ජනතාවගේ ආගම වූ බෞද්ධාගම සම්බන්ධ ව අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය යි.[5]

1815 මාර්තු 2 වැනිදා ලංකාව බ්‍රිතාන්‍ය කිරීටයට යටත් වුව ද, බුදුදහම මෙරට රාජ්‍යාගම බවට පත් වූයේ නැත.[6] එසේකුදු වුවත් බුද්ධශාසනය කඩ කළ නොහැකි බවත්, ආගමික කටයුතු ද සංඝයා ද, විහාරස්ථාන ද, පවත්වන්ඩ සහ ආරක්ෂා කරන්ඩ ඕනෑ වගක් මෙම ගිවිසුම විසින් පිළිගන්නා ලද්දේය. මේ වූකලි එසේක් රාජ්‍ය ආගම සේ සම්මානිත සම්බුද්ධ ශාසනයේ "කඩ නොකළ හැකි" බව බ්‍රිතාන්‍ය කිරීටය විසින් පිළිගැනීමක් විය.

වර්ෂ 1940 දී සෝල්බරි සාමි ප්‍රධාන කොමිෂන් සභාවේ යෝජනා පදනම් කර ගෙන ලංකාණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කරන ලදි. නව ආණ්ඩු ක්‍රමය වර්ෂ 1946 ලංකාණ්ඩු ක්‍රම රාජඥාව මගින් 1946 මැයි මාසයේ දී සම්මත විය.[7]

1946 ජන සංඛ්‍යා ලේඛන අනුව එම කාලය වන විට සාමාන්‍යයෙන් දිවයිනේ බෞද්ධයන්ගේ සංඛ්‍යාව 4,288,000 ක් පමණ වේ. ආගමික අංශයෙන් බලන විට බෞද්ධයෝ බහුතර ජනතාව වූහ. එහෙත් රජය හා ආගම් අතර පැවැති සම්බන්ධයේ දී පාලකයන්ගේ ආගම වූ ක්‍රිස්තියානියට තරම් සැලකිල්ලක් සෙසු ආගම්වලට මේ වන විටත් රාජ්‍ය පාලන තන්ත්‍රයෙන් නොලැබිණි.[8]

ක්‍රිස්තියානිය විදේශිය පාලන කාලය මුළුල්ලේම විශේෂ වරප්‍රසාද ලැබුවකි. මේ යුගයේ සිදු වූ ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණය එතෙක් ක්‍රිස්තියානිය හිමි කර ගෙන තිබූ විශේෂ වරප්‍රසාද එසේම තහවුරුවීමටත් රාජ්‍ය සම්බන්ධයෙන් ඈත් ව තිබූ බුදු දහම ඇතුළු අනෙක් ආගම් ඒ තත්ත්වයෙහිම තවදුරටත් පැවැතිමට හේතු විය.[9] මේ තත්ත්වය උද්ගත වූයේ 1946 ලංකා රාජ්‍ය සභා ආඥාපනතේ 29 (2) වගන්තියෙහි ඇතුළත් වන ආගම් හා ආගමික ආයතන පිළිබඳ ව්‍යවස්ථාව නිසාය. එකි 29 වන වගන්තියෙහි මෙසේ සඳහන් වේ.

29 (1) මේ ආඥාපනතේ බලතලවලට යටත් ව දිවයිනේ සාමය, ශාන්තිය හා මනා පාලනය සඳහා නිති පැනවීමේ බලය පාර්ලිමේන්තුවට පැවරේ.

(2) එබදු නිති අනුව කිසිවකුට නො කළ හැකි දේ නම්

(1) කිසිම ආගමක් රිසි සේ ඇදහීමේ නිදහසට බාධා කිරීම හෝ අවහිර කිරීම හෝ,

(ii) කිසිම ජාතියකට හෝ ආගමක ජනයාට විඳින්නට සිදු නොවන අවහිරකම් වලට හෝ බාධා වලට අන් කිසිදු ජාතියක හෝ ආගමක ජනයාට විඳින්නට සැලැස්වීම.

(iii) අනෙක් ජාතිවල හෝ ආගම් වල ජනයාට නුදුන් වරප්‍රසාදයක් හෝ ලාභයක් කිසිදු ජාතියක හෝ ආගමක ජනයාට නො දීම.

(iv) 1. ඒ ඒ ආගම පාලනය කරන අධිකාරී බලයේ කැමැත්ත නො ගෙන කිසිදු ආගමික ආයතනයක නීති සංස්ථාව වෙනස් කිරීම.

2. ඉදින් ආගමික ආයතනයක් නීති ගත කළ ආයතනයක් වශයෙන් තිබේ නම් එබඳු වෙනස්කම් එහි පාලන අධිකාරීන්ගේ ඉල්ලීමක් නැති ව කළ නො හැකි බව.[10] රාජ්‍ය සභා ආඥා පනතෙහි 29 (2) (iv), (2) උප වගන්තිය එහි මුල් කෙටුම්පතට අයත් ව නො තිබිණි. කෙටුම්පත අවසාන වශයෙන් ලංකාවේදී පිළියෙළ කළ අවස්ථාවෙහි එය අමුතුවෙන් එක් කරන ලද්දකි. රාජ්‍ය සභා ආඥා පනතේ 29 වැනි වගන්තිය ඇතුළත් කිරීමෙන් කෙටුම්පත් කරුගේ මූලික අදහස වූයේ ආගමික ආයතන දේශපාලන ක්ෂේත්‍රයෙන් පිටත සංස්කෘතික ආයතන වශයෙන් තබා ගැනීම බව සර් අයිවර් ජෙනිංග්ස් ගේ අදහස විය." [11] එහෙත් අවසාන කෙටුම්පතේ යට කී උප වගන්තිය ඇතුළත් වීම නිසා සිදුවූයේ ක්‍රිස්තියානිය එතෙක් ලබා තිබූ බලතල හා වරප්‍රසාද එසේම රැක ගන්නට ඉඩ තිබිය දී අනෙක් ආගම් වලට යළි කිසිදු සහනයක් ලබා ගත නො හැකි පරිද්දෙන් රාජ්‍ය පාලන ක්ෂේත්‍රයෙන් පරිබාහිර වීම යි. මේ අනුව බුදුදහම දිවයිනේ බහුතර ජනතාවගේ ආගම වුව ද එය නැවත රාජ්‍ය ප්‍රමුඛත්වයට පත් විය නො හැකි පරිද්දෙන් ආණ්ඩු ක්‍රමය මගින්ම ව්‍යවස්ථා ගත වීම බුද්ධ ශාසනය සම්බන්ධයෙන් මේ යුගයේ දී සිදු වූ විශාලතම පරාජයකි.

ක්‍රිස්තියානිය සම්බන්ධයෙන් තත්ත්වය මීට ඉඳුරා වෙනස් විය. ක්‍රිස්තියානි ආගමික ආයතනවලට ස්වකීය තත්ත්වය ආරක්ෂා කර ගැනීම සඳහා අසමසම බලයක් මෙම ව්‍යවස්ථාව මගින් හිමි කර දී තිබේ. මෙතෙක් විශේෂ රාජ්‍ය වරප්‍රසාද ලැබූ ක්‍රිස්තියානි ආගමික ආයතන බොහොමයක් මේ වන විට නීති ගත ආයතන බවට පත් ව තිබිණි. එබැවින් එම ආයතනයන් සතු වූ බලතල එහි පාලක අධිකාරීන් ගේ ඉල්ලීමක් නොමැති ව නැවත වෙනස් නො කළ හැකි පරිද්දෙන් 29 (2), (iv) (2) උප වගන්තිය යටතේ පාර්ලිමේන්තු බලය සීමා කැරිණි.